කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2023 දෙසැම්බර් මස 02 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2023 දෙසැම්බර් මස 01 දින මධ්‍යහන 12.00 ට නිකුත්කරන ලදි.**

**ගිනිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය මේ වන විට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී ඇත. එය 2023 දෙසැම්බර් 02 දින වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී 2023 දෙසැම්බර් 03 දින වන විට සුළි කුණාටුවක් දක්වා තවදුරටත් වර්ධනය වනු ඇත. මෙම පද්ධතිය, ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නයෙන් බටහිරට බරව වයඹ දෙසට ගමන් කර උතුරු තමිල්නාඩු වෙරළ තීරයට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ.**

උතුරු, උතුරු-මැද, නැගෙනහිර සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ, ඇතැම් ස්ථානවල **මි.මී. 100** ට වැඩි තද වැසි ද ඇතිවිය හැක.

දිවයිනේ සෙසු පළාත්වල පස්වරු 1.00 න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වල ඇතැම් ස්ථානවල මි.මී. 75 ක පමණ තරමක් තද වැසි ද ඇතිවිය හැක. දකුණු පළාතේ උදේ කාලයේදීද වැසි ඇති විය හැක.

උතුරු, උතුරු මැද, වයඹ සහ දකුණු පළාත්වලත් ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත්, විටින් විට හමන පැ.කි.මී. (40-50) පමණ තද සුළං බලාපොරොත්තු වේ.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 02 DECEMBER 2023
**Issued at 12.00 noon on 01 December 2023**

**The low-pressure area over the southeast Bay of Bengal has developed in to a depression. It is likely to intensify into a deep depression by 02 December 2023 and it will further develop in to a cyclonic storm by 03 December 2023. This system is likely to move west-northwestwards closer to northern coast of Sri Lanka towards North Tamil Nadu coast.**

Showers or thundershowers will occur at times in Northern, North-central, Eastern and North-western provinces and heavy showers **above 100 mm** are likely at some places.

Showers or thundershowers will occur at several places in other provinces of the island after 01.00 p.m. Fairly heavy showers about 75 mm are likely at some places in Western, Sabaragamuwa and Central provinces.

Showers may occur in Southern province during the morning too.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2023 දෙසැම්බර් මස 01 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**ගිනිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය මේ වන විට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී ඇත. එය 2023 දෙසැම්බර් 02 දින වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී 2023 දෙසැම්බර් 03 දින වන විට සුළි කුණාටුවක් දක්වා තවදුරටත් වර්ධනය වනු ඇත. මෙම පද්ධතිය, ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නයෙන් බටහිරට බරව වයඹ දෙසට ගමන් කර උතුරු තමිල්නාඩු වෙරළ තීරයට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ.**

**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල යාත්‍රා කිරීම අවදානම් බැවින් නැවත දැනුම් දෙනතුරු එම මුහුදු ප්‍රදේශයට යාත්‍රා නොකරන ලෙස සහ ගාල්ල සිට මාතර හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල අවධානයෙන් කටයුතු කරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය , ත්‍රිකුණාමලය, පොතුවිල් සහ හම්බන්තොට හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති ඇතිවේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල විශේෂයෙන් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ වල සුළං ඊසාන හෝ වයඹ දෙසින් හමා එන අතර සුළං වේගය පැ.කි.මී.(30-40) පමණ වේ. මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60 -70) දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ ඉතා රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
**Issued at 12.00 noon on 01 December 2023**

**The low-pressure area over the southeast Bay of Bengal has developed in to a depression. It is likely to intensify into a deep depression by 02 December 2023 and it will further develop in to a cyclonic storm by 03 December 2023. This system is likely to move west-northwestwards closer to northern coast of Sri Lanka towards North Tamil Nadu coast.**

**It is dangerous to engage in activities in the sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanthurai, Trincomalee and Batticaloa. Therefore, Naval and fishing communities are advised not to venture into the above sea areas until further notice.**

**Naval and fishing communities are engaged in activities in the sea areas off the coast extending from Galle to Pottuvil via Matara are request to be vigilant.**

**Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times off the coast extending from Puttalam to Galle via Mannar, Kankasanthurai, Trincomalee, Pottuvil and Hambantota. Showers or thundershowers will occur at several places in the other sea areas around the island particularly during the evening or night.

**Winds:**

Winds will be north-easterly or north-westerly and wind speed will be (30-40) kmph in the sea areas around the island. Wind speed may increase up to (60-70) kmph in the sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanthurai, Trincomalee and Batticaloa.

**State of Sea:**

The sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanthurai, Trincomalee and Batticaloa will be very rough. The other sea areas around the Island may be fairly rough at times.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි